# පළමු පරපුරේ සිට තුන්වන පරපුර දක්වා...

## 1979



පළමු පරපුරේ මුල්ම ජංගම දුරකථනය ලෙස සැලකෙනුයේ මෙම දුරකථනයයි. මෙය මෝටර් රථවල ස්ථිරව සවිකරන දුරකථනයක්.

## 1985

තැන තැන රැගෙන යා හැකි තරමක් බරින් වැඩි එහෙත් ප්‍රබල ධාරිතාවකින් යුත් මෙම දුරකථනය ප්‍රථම රැගෙන යා හැකි දුරකථනය වශයෙන් සැලකේ.



## 1987

ප්‍රථම සැහැල්ලු දුරකථනය නිපදවූයේ 1987 වසරේදියි. නමුත් මෙහි බර ග්‍රෑම් 900 ක් පමණ විය. මේ ඡායාරූපයෙන් දැක්වෙන පරිදි සැහැල්ලු දුරකථන නිපදවීම ආරම්භ වූයේ 1991 වසරේදීයි.



## 1993

NTT DOCOMO සමාගම මගින් ලොව පළමු ඩිජිටල් දුරකථනය හඳුන්වා දෙනු ලැබීය.

## 1999

දෙවන පරපුරේ ජංගම දුරකථන හඳුන්වා දෙනු ලැබුවේද එම සමාගම මගිනුයි. එය ලොව පළමු අන්තර්ජාල පහසුකම් සහිත දුරකථනය ද වේ.

**ජංගම දුරකථනය සුඛෝපභෝගී භාණ්ඩයක් ලෙස සැලකූ කලක් ද තිබිණි. ව්‍යාපාරිකයන් අත්ල මත පමණක් තිබූ එම දුරකථනය දැන් කම්කරුවාගේ අත්ල මතට ද පැමිණ තිබේ. මුලදී රුපියල් ලක්ෂයකට ආසන්න මිලකට අලෙවි වූ මෙම දුරකථනය දැන් රුපියල් දෙදහසකට ද මෙරට වෙළෙඳ පොළෙන් මිලදී ගත හැයිකි. මිල ශීඝ්‍රයෙන් අඩුවුවත් තාක්ෂණය අතින් ශීඝ්‍රයෙන් ඉහළ යන මෙම දුරකථනයේ නවතම තාක්ෂණය වන තෙවන පරපුරේ දුරකථන ද (3G) දැන් මෙරටට හඳුන්වා දී අවසන්. මෙවර අප හඳුන්වා දෙනු ලබනුයේ මෙසේ පළමු පරපුරේ සිට තෙවන පරපුර දක්වා ජංගම දුරකථන ආ ගමන ගැනයි.**

2003 වසරේදී එළිදැක්වූ මෙම දුරකථනය ලොව ප්‍රථම වීඩියෝ දර්ශන සහිත දුරකථනයයි.




## 2001

තුන්වන පරපුරේ (3 G) දුරකථනය මෙම වසරේදී හඳුන්වා දෙනු ලැබීය. W. CDMA තාක්ෂණයෙන් යුත් මෙම දුරකථන මගින් අධිවේගී ලෙස දත්ත හුවමාරු කරගත හැකියි.

මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේද තෙවන පරපුරේ දුරකථනයකි. ඩිජිටල් කැමරාවකින්ද සමන්විත වන මෙය නිපදවූයේ 2003 වසරේදීයි.



NTT DOCOMO සමාගම මගින් නිපදවා තිබෙන මෙයCDMA 2000 නම් වැඩිදියුණු කළ තාක්ෂණයකින් නිපදවා තිබෙන්නක්. මෙමගින් පෙරටත් වඩා අධිවේගී ලෙස දත්ත සම්ප්‍රේක්ෂණය කළ හැකියි.



## 2003

Vodafone's සමාගම මගින් 2003 වසරේදී හඳුන්වාදුන් මෙම දුරකථනයෙන් රූපවාහිනී වැඩසටහන් නැරඹීමේ පහසුකම් ද සළසා දී තිබේ.




- මොහාන්